**තුම්පනේ ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට තුම්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති ලිපිද්‍රව්‍ය, ලේඛන හා සනීපාරක්ෂක තොගය රු.301,795 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති ජල උපාංග තොගය රු.505,653 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | කඩිනමින් නිරවුල් කර විගණනයට ඉදිරිපත් කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සුජාතා විදුහල ඉදිරිපිට ගොඩනැගිල්ලේ අභ්‍යන්තර බිත්ති ඉදිකිරීම සඳහා අවස්ථා 03 කදී වැයකළ රු.229,597 ක් මූලධන වියදම් යටතේ හර නොකර ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු යටතේ දක්වා තිබුණි. එසේම එම වියදම ප්‍රාග්ධනිත කරද නොතිබුණි. | කඩිනමින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ඉදිරිපත් කල යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ දැක්විය යුතු රු.82,781 ක ඒකක 63 ක් ලිපිද්‍රව්‍ය තොග යටතේ ගිණුම්ගත කර තිබුණි. | -එම- | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.11,862,037 ක ගිණුම් විෂයයන් 03 කට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන්ගේ එකතුව රු.12,288,609 ක් වූයෙන් රු.530,812 ක වෙනසක් විය. | වෙනස් කම් පරික්ෂා කර නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |
| (ආ) | 2019 වර්ෂයේ පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබූ කාර්යාලීය උපකරණ ශේෂය හා ඊට අදාළ උපලේඛනයේ ශේෂය අතර රු.1,939,500 ක නොසැසඳීමක් පැවතියද එම නොසැසඳීමට හේතු සොයා බලා වත්කම් ශේෂ නිවැරදි නොකර උපලේඛනයේ ස්ථාවර වත්කම් යටතේ සභා ශාලා මේසයක් ලෙස රු.1,939,500 ක වත්කමක් ව්‍යාජ ලෙස දක්වා සමාලෝචිත වර්ෂය තෙක් ගිණුම් තුලනය කර තිබුණි. | කඩිමින් සොයා බලා විගණනයට යොමු කරන බව. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජර්නල් සටහන් 53 යටතේ රු.16,147,144 ක ණයගැති ශේෂ 151 ක් හා ජර්නල් සටහන් 54 යටතේ රු.40,979,132 ක ණයහිමි ශේෂ 347 ක් සමුච්චිත අරමුදලට ලියාහැර තිබුණි. | කළමනාකරණ කමිටුවෙන් අනුමැතිය ලබාගත් බව | ණයගැති හා ණය හිමි ශේෂ කපාහැරීමේදී විධිමත් අනුමැතියක් ලබාගත යුතු බව |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.1,892,397 ක ණයගැති ශේෂ 15 ක හා ණයහිමි ශේෂයකට අදාළ ලිපි ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | තොරතුරු තහවුරු කරගත් පසු නිවැරදි කරන බව. | ගිණුම් ශේෂයන්ට අදාළ ලිපි ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| | 154(1) වගන්තිය | අක්කර 03 රූඩ 03 පර්චස් 20.3 ක ඉඩම් වපසරියක් සහිත මොරගස්කොටුව වත්ත නැමැති ඉඩම ඉඩම් කට්ටි 35 කට වෙන්කර රු.28,300,000 ක් ලෙස තක්සේරු කර සියළු ඉඩම් කට්ටි වෙන්දේසි කර තිබුණද ඉන් ඉඩම් කට්ටි 33 කින් විකුණුම් වටිනාකමින් අයවිය යුතු සියයට 1 ක බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ආයතන දැනුවත් කරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර විකුණුම් වටිනාකමින් අදාළ බදු අයකරගත යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මු.රෙ. 104(3) හා 104(4) | 2014 සිට 2023 දක්වා කාලය තුළ අනතුරට පත් වූ වාහන 05 ක රු.181,670 ක මු.රෙ. පරීක්ෂණ අවසන් කර නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ පරීක්ෂණ අවසන් කර ඇති බව. | නිර්දේශ ක්‍රියාත්මක කල යුතුය. |
| (ii) | මු.රෙ. 571(3) | 2015 සිට 2019 දක්වා කාල පරිච්ඡේදය තුළ කාලය ඉකුත් වූ රු.1,231,095 ක තැන්පත් 62 ක් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2020 – 2022 කාලයෙන් පසුව සභාව සතු වාහන 03 ක ඉන්ධන දහන පරීක්ෂණ සිදුකර නොතිබුණි. | අදාළ පරීක්ෂාව කඩිනමින් සිදු කරන බව. | චක්‍ර ලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,534,929 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,743,785 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් හා බදු | 4,044,000 | 4,575,130 | 5,425,673 | 1,582,183 | 3,524,100 | 4,194,538 | 4,259,000 | 2,432,726 |
| (ii) | කුලී | 4,858,600 | 6,422,793 | 6,546,551 | 285,089 | 5,156,000 | 4,780,730 | 5,261,153 | 408,847 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,650,000 | 1,513,300 | 1,702,421 | - | 1,640,000 | 1,683,077 | 1,493,955 | 189,121 |
| (iv) | වෙනත් ආදායම් | 48,380,500 | 26,861,411 | 33,624,306 | 27,019,483 | 48,643,000 | 42,685,891 | 47,448,703 | 33,782,378 |
| | | 58,933,100 | 39,372,634 | 47,298,951 | 28,886,755 | 58,963,100 | 53,344,236 | 58,462,811 | 36,813,072 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කායර්සාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ.**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.1,017,262 ක් වූ අතර, ඒකකයක වරිපනම් හිඟය රු.10,000 ඉක්මවූ වරිපනම් ඒකක 02 කින් එකතුව රු.44,580 ක් ද රු.5,000 ඉක්මවූ වරිපනම් ඒකක 11 කින් එකතුව රු.107,487 ක් විය. | හිඟ ආදායම් රැස් කිරීමට සැලසුම් කර ඇති බව. | හිඟ ආදායම් අයකරගත යුතුය. |

**(ආ) වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජල ගාස්තු හිඟය රු.1,101,131 ක් වූ අතර ඒකකයක ජල ගාස්තු හිඟය රු.10,000 ඉක්මවූ ඒකක 2 කින් රු.33,706 ක් ද රු.5,000 ට වැඩි ඒකක 18 කින් රු.117,894 ක් විය. | හිඟ ආදායම් අයකරගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |

**(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.842,827 ක් හා මුද්දර ගාස්තු රු.23,782,820 ක් විය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවල පුනරාවර්තන ආදායම් ප්‍රාදේශීය සංවර්ධනයට යොදවා ගැනීමකින් තොරව රු.32,481,422 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ඉදිරියේදී සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට කටයුතු කරන බව. | අතිරික්ත මුදල් සංවර්ධන කටයුතු සඳහා යොදවාගත යුතුය. |
| (ආ) | වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කරන ලද රු.1,606,000ක සංවර්ධන යෝජනා 03 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව. | අදාළ කාල පරිච්ඡේද තුළ ඉටු කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේ සපිරි ගමක් ප්‍රජාපාදක ප්‍රතිපාදන යටතේ ජල ව්‍යාපෘති 02 ක එකතුව රු.4,000,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන මත ගිවිසුම්ගතව කොන්ත්‍රාත්කාර පාර්ශවයන්ට ඉදිකිරීම් පවරා තිබුණද එම ජල ව්‍යාපෘති දෙකෙහි භාවිතයට ගතහැකි පරිදි වැඩ අවසන් නොකර 2021 වසර තුළ ඉදිකිරීම් අතරමඟ නවතා තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන | ව්‍යාපෘතිය පවරාගැනීමට හා පවත්වාගෙන යාමට හැකියාවක් නොමැති බව. | සැලසුම් කරන ලද කාර්යයන් ඉටුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිනට මෙම ව්‍යාපෘති සඳහා ගෙවන ලද රු.3,890,024 ක මුදල නිශ්ඵල වී තිබුණි. | | |
| (ඈ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 (ආ) වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ලෙස වලවල් නිසි කාල සීමාව තුළ පවිත්‍ර කිරීම හා හිස් කිරීමට හැකිවන පරිදි ගලී රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් නොමැති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම පළාත් සභාවේ කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු හිටපු සභාපතිවරයා භාවිතා කළ මෝටර් රථය 2014 වරසරේදී ගිනි ගැනීමකට ලක් වී අනතුරක් සිදුවී තිබුණද ඒ සම්බන්ධව හිටපු සභාපතිවරයා විසින් පොලිසියේ පැමිණිලි කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධව අනතුර සිදුවී වසර 03 කට පසුව මු.රෙ.104(3) පරීක්ෂණයක් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් මු.රෙ.104(4) පරීක්ෂණ සිදුකර වගකිවයුත්තන් හඳුනාගෙන නොතිබුණි. මෙම මෝටර් රථය සම්පූර්ණයෙන් විනාශ වී තිබූ අතර 2023 පෙබරවාරි 16 දිනැති සභා වාර්තාව අනුව මෝටර් රථය පන ගැන්වීමට පමණක් වැයවන අලුත්වැඩියා වියදම රු.1,009,400 ක් බැවින් දළ වශයෙන් රු.1,009,400 ඉක්මවන අලාභයක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. | මු.රෙ.104 (3) පරිදි පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනාගන්නා බව. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභය අයකළ යුතු අතර අදාළ නීතිමය ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව රු.3,777,159 ක් වූ අතර ඉන් වසර 3 ත් 5 ත් කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.1,431,615 ක් හා වසර 5 ට වැඩි කාලයක් පවතින එකතුව රු.1,418,190 ක් විය. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂයන් අයකළ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.6,470,628 ක් වූ අතර ඉන් වසර 3 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.200,000 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.4,000,000 ක් විය. | පරීක්ෂා කර බලා නිරවුල් කරන බව. | ණයහිමි ශේෂයන් නිරවුල් කළ යුතුය. |
| (ඇ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධි විධාන අනුව සංවර්ධන අවසර පත්‍රයක් ලබාගෙන ගොඩනැගිලි ඉදිකළ යුතු වුවත් සභාව විසින් අයදුම්පත්‍රවල අඩුපාඩු හේතුවෙන් ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම අනුමත කර නොතිබියදී ඒ ගැන සැලකීමකින් තොරව අවස්ථා 03 කදී ගොඩනැගිලි ඉදිකර තිබුණද ඒ සම්බන්ධව සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුමගමනය කර නොතිබුණි. | විධිමත් ක්‍රියාමාර්ග ගන්නා බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කළ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන සඳහා ලබා දී තිබුණු රු.4,000,000 ක මුදල අදාළ අරමුණින් බැහැරව සේවක පඩි ගෙවීමට යොදා ගැනීම සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ මු.රෙ.104 (4) පරීක්ෂණය අනුව ඒ සඳහා වැයකළ මුදල් මාසයක කාලයක් තුළ පළාත් සභාවට ගෙවීම හෝ අදාළ මුදල් නොගෙවුවහොත් පළාත් සභාව විසින් ලබා දෙන මුද්දර ගාස්තු හා උසාවි දඩ රඳවාගෙන එම මුදල් අදාළ අමාත්‍යාංශයට යැවිය යුතු බවට ලබා දී තිබූ නිර්දේශ සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | පළාත් පාලන ආයතන දැනුවත් කර ඇත. | විධිමත් අනුමැතීන්ට යටත්ව වියදම් කළ යුතුය. |

**3.4 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.27,020,461 ක වාහන 04 ක් හා යන්ත්‍රයක් වසර 01 ත් වසර 08 ත් අතර කාල පරාසයක සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. වි | අලුත්වැඩියා සිදු කිරීම හා වෙන්දේසි කිරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි වත්කම් අලුත්වැඩියා කිරීමත් අනෙකුත් වත්කම් අපහරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව පරිහරණය කරන සුසාන භූමි 50 ක භූමියේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.. | පැවරුම් නියෝග ලබාගැනීමට යොමු කර ඇති බව. | නීත්‍යානුකූලව අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය තුළ පැවති එකතුව රුඩ.17 පර්චස් 127 ක ඉඩම් කැබලි 05 ක වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කර ගිණුම්ගත කරන බව. | වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| | අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 10 ක පුරප්පාඩු 20 ක් ද තනතුරු 02 ක අතිරික්තතා 20 ක් ද පැවතුණි. | පුරප්පාඩු සඳහා ආදාල පාර්ශවයන් දැනුවත් කර ඇති අතර අතිරික්ත කාර්ය මණ්ඩලය රාජකාරී සඳහා යොදවාගන්නා බව. | අනුමත කාර්යමණ්ඩලය අනුව අදාළ කටයුතු කළ යුතුය. |
| (ආ) | **සේවක ණය** | | |
| | 2018 වසරේ සිට 2023 වසර දක්වා කාලපරිච්ඡේදයට අදාළව ස්ථාන මාරුවී ගොස් තිබුණු නිලධාරීන් තිදෙනෙකුගේ රු.304,287 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | ස්ථාන මාරු වී ගිය ආයතන දැනුවත් කර ඇත. | ණය අයකර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
### තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගන්නා බව. | අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |